# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/46 – 2017 ජූලි 20 වැනි බ්‍රහස්පතින්දා – 2017.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 169 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2017/යූඩීඒ/18.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කැප්‍රාලේ/8/4/අත්/1/කියංනෑම්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 ජූලි මස 17 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්,කැස්බෑව.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කො/කේඑස්බී/2017/150 හා 2017.05.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගොරකබැද්දේවත්ත හෙවත් දෙල්ගහවත්ත, වරි. අංක 1, මොරටුව පාර – ප්‍රමාණය: හෙක්. 4.9277**

උතුරට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 39,27,26,24,23,22, මොරටුව පාර (කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 1), කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 20,21,19,16,15,46,9 සහ 56; නැගෙනහිරට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 21,19,16,15,46,9,56, කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 03 සහ ප්‍රවේශ මාර්ගය; දකුණට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 03, කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 100; බටහිරට: 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 97,90,89,84,74,73,64,58,45,44,39,27,26,24,23 සහ 22.

08-149



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 170 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2016/වීඊ/359.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:කේඩීඑස්/යූඩීපී/එල්ඒජී/එස්ඕ.ඊඑස්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 ජූලි මස 13 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කරගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, උඩපළාත.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරලේ සුළු කොට්ඨාසයේ, සොගමාවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/යූඩීපී/2017/17 හා 2017.05.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සොගමාවත්ත – ප්‍රමාණය: හෙක්. 1.7517**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන සොගමාවත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන සොගමාවත්ත, මළඇළ සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

08-150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.